// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශේෂ

අංක 2112/33 - 2019 පෙබරවාරි මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2019.02.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 6/1996

**1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනත**

නිවේදනය

**(පළමුවන උපලේඛනයේ (1) වන ඡේදය)**

අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය තලතා අතුකෝරළ වන මම, මෙම නිවේදනය මගින්, 1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනයේ (1) වන ඡේදයේ කාර්ය සඳහා මුදල වශයෙන් 2019 මාර්තු මස 15 වැනි දින සිට බලපවත්වන පරිදි රුපියල් මිලියන පහක මුදල වෙනුවට රුපියල් මිලියන විස්සක මුදල නියම කරමි.

මෙම මූල්‍යමය අගය ඉහළ දැමීම 2019 මාර්තු මස 15 වැනි දිනට පෙර මහාධිකරණයේ පවරා ඇති නඩු කටයුතු සඳහා බල නොපැවැත්විය යුතු ය.

1996 අංක 10 දරන පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) පනතේ පළමුවන උපලේඛනයේ (1) වන ඡේදය යටතේ කරනු ලදුව, 2012 මැයි මස 25 වැනි දින අංක 1759/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය, ඒ යටතේ යථා පරිදි කරන ලද කිසිවකට අගතියක් නොවන පරිදි මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

තලතා අතුකෝරළ,
අධිකරණ සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 පෙබරවාරි මස 22 වැනි දින,
කොළඹ දී ය.

03 - 773

1A - G 29555 — 67 (2019/02) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*